# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**නිවාඩු කාලීන පැවරුම්**

**සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය**

# 4 ශ්‍රේණිය - පරිසරය(හයවන සතිය)

**පුනරීක්ෂණ අභ්‍යාස**

1. පහත සඳහන් කවිය පාඩම් කරගෙන ගායනා කරන්න.

බඩගිනි වෙලා මා ගියකළ පුතුගේ ගෙට
මැනලා වී ටිකක් දුන්නයි මල්ලකට
ගම්දෝ නොගම්දෝ කියලා සිතුනි මට
මැනල ද පුතේ කිරි දුන්නේ මා නුඹට

2. පහත සඳහන් දෙබස කියවා ගැටුම නිරාකරණය වන ආකාරයට කතාව ඉදිරියට ගොඩනගන්න.

කපුටාගේ කූඩුවේ කෙවිලිය බිත්තර දමා ඇති බව දැනගත් කපුටා කෙවිලියගෙන් ඒ බව විමසයි.

කපුටා- "ඇයි ඔයා මගේ කූඩුවේ බිත්තර දම්මේ"
කෙවිලිය - "සමාවෙන්න මම කූඩු හදන්න දන්නේ නෑ"
කපුටා - "එහෙම කියලා හරියනවද?
මම කොහොමද පැටව් ගොඩකට කෑම හොයන්නේ?"

3. ඔබ කැමති ස්ථාන දෙකකින් පස් සාම්පල ලබාගන්න.ඒවා විනිවිද පෙනෙන බඳුන් දෙකකට දමා ජලය පිරෙන තෙක් යොදා බඳුන් වසා හොඳින් සොලවන්න.දුටු දේ පහත වගුවේ ලියන්න.

| නිරීක්ෂණය කළ දේ | පළමු පස් සාම්පලය | දෙවන පස් සාම්පලය |
|---|---|---|
| 1.පසෙහි වර්ණය | | |
| 2.වැලි/මැටි/බොරළු බහුල පසක් ද යන්න | | |
| 3.පසෙහි දක්නට ඇති ජීව හා අජීව ද්‍රව්‍ය | | |
| 4.පතුලේ තැන්පත් වීඇති ද්‍රව්‍ය | | |
| 5.ඊට ඉහලින් තැම්පත් වී ඇති ද්‍රව්‍ය | | |
| 6.ජලයේ පා වෙන ද්‍රව්‍ය | | |
| 7. ජලයේ වෙනස් වී ඇති වර්ණය | | |